# පළමුවන විමලධර්මසූරිය රජුගේ රාජකීය මුද්‍රාව පිළිබඳ අධ්‍යයනයක්

ඊ.ඩබ්.ඒ.එච්.සී. ගුණසිංහ[1]

උඩරට රාජධානිය ස්ථාවර රාජධානියක් වශයෙන් ස්ථාපනය කරනු ලැබූ පාලකයා වශයෙන් කොනප්පු බණ්ඩාර හෙවත් පළමුවන විමලධර්මසූරිය රජු සැලකේ. රාජත්වයට පත්වීමට පෙරාතුව හෙතෙම පෘතුගීසින්ගේ රැකවරණය යටතේ සිටිමින් යුද ශිල්ප හදාරා ප්‍රවීණත්වයක් ලැබීය. පසුව පෘතුගීසින් සමග කන්ද උඩරට ආක්‍රමණයට සහභාගි වූ කොනප්පු බණ්ඩාර, සුදුසු අවස්ථාවේදී සිහසුන තමා සතු කරගනිමින් එම ප්‍රදේශයේ සිංහල රාජධානියක් ස්ථාපනය කිරීමට සමත් වූයේ ය. මෙම **අධ්‍යයනයේ අරමුණ** වූයේ පළමුවන විමලධර්මසූරිය රජුගේ රාජකීය මුද්‍රාව පිළිබඳ අධ්‍යයනය කිරීමයි. රජුගේ මුද්‍රාවේ සුරතෙහි අසිපතක් ඇතිව වස්ත්‍රාභරණයෙන් සැරසුණු මකුටධාරී පුද්ගලයකුගේ රුවක් අන්තර්ගත අතර එයින් නිරූපණය කෙරෙනුයේ කවුරුන් ද යන්න විමසා බැලීම **අධ්‍යයන ගැටළුව** විය. ඒ සඳහා තොරතුරු සපයා ගැනීමට යොදාගත් **අධ්‍යයන ක්‍රමවේදය** වූයේ මූලාශ්‍රය අධ්‍යයනයයි. පළමුවන විමලධර්මසූරිය රජුගේ රාජකීය මුද්‍රාවේ දක්වෙන රුවෙන් නිරූපණය කෙරෙනුයේ රජු විසින් ස්වකීය ආරක්ෂක දෙවියා වශයෙන් පිළිගනු ලැබූ කිසියම් දෙවි කෙනෙකු විය හැකි බවට **උපකල්පනය** කෙරුණි. බොහෝ කලක් පෘතුගීසින් ඇසුරේ ගත කළ හෙයින් රජුගේ ඇතැම් කටයුතු සඳහා පෘතුගීසී ආභාෂය ලැබී තිබුණි. පෘතුගීසී රාජ්‍ය ලාංඡන සහ රාජකීය මුද්‍රා සඳහා කතෝලික දහමේ සංකේත සහ ශාන්තුවරුන්ගේ රුව යොදා ගැනීම සාමාන්‍යයෙන් සිදුවිය. පළමුවන විමලධර්මසූරිය රජු ස්වකීය රාජකීය මුද්‍රාවට ද ආරක්ෂක දෙවියෙකුගේ රුවක් යොදාගත්තේ එකී ආභාසය නිසා විය යුතු ය. තවද රජුගේ මුද්‍රාවේ සිටින දෙවියන් එවකට කන්ද උඩරට ජනතාවගේ වන්දනාවට පාත්‍ර වූ නාථ, විෂ්ණු හෝ කතරගම දෙවිවරුන් නොවන බවත්, වර්තමානය වන විට ජන වන්දනාවෙන් බැහැර කරනු ලැබ සිටින්නා වූ, යුධ ප්‍රයාණයට සම්බන්ධ දෙවි කෙනෙකුන් ලෙස ප්‍රකට නාගසේ දෙවියන් විය හැකි බවත් මෙහිදී **නිගමනය** කෙරිණි.

ප්‍රමුඛ පදඃ පළමුවන විමලධර්මසූරිය, උඩරට රාජධානිය, රාජකීය මුද්‍රා, නා ගසේ දෙවියෝ

[1] සහකාර කථිකාචාරිනි කථිකාචාර්ය , ඉතිහාස අධ්‍යයන අංශය , කැලණිය විශ්වවිද්‍යාලය. hachagu@gmail.com